**සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතිය - 2019**

**-------------------------------------------------------------**

සුළං බලශක්ති උත්පාදන ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ලංකා විදුලිබල මණ්ඩලය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2017 නොවැම්බර් 22 දින එළඹි අංක 3585 - එස්ආර්අයි දරණ ණය ගිවිසුමේ IV ව්‍යවස්ථාවේ 4.02 වගන්තිය සහ ව්‍යාපෘති පරිපාලන අත්පොතේ V(ඇ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලසීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ පිවිතුරු සහ විශ්වශනීය බලශක්තිය උත්පාදනය වැඩිකිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම් ප්‍රකාරව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 39,923.06 කට සමාන එජඩො මිලියන 256.70 වන අතර ඉන් රු. මිලියන 31,104.84 කට සමාන එජඩො මිලියන 200 ක් මූල්‍යයනය කිරීමට ආසියානු සංවර්ධන බැංකුව එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 8,818.22 කට සමාන එජඩො මිලියන 56.70 ක් මූල්‍යනය කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය අපේක්ෂා කෙරේ. ව්‍යාපෘතිය එහි කටයුතු 2018 ජනවාරි 01 දින ආරම්භ කරන ලද අතර 2021 දෙසැම්බර් 31 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මතය

ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.1 ගිණුම්කරණ අඩුපාඩුව**

| ගිණුම්කරණ අඩුපාඩුව | මුදල (රු.) | බලපෑම | කළමණාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| ------------------------ | ------- | ---------- | -------------------- | ---------- |
| 2019 වර්ෂයේදී මිළදී ගන්නා ලද කැමරා සහ උපකරණ ස්ථාවර වත්කම් ලෙස හඳුනා ගැනීම වෙනුවට වියදම් ලෙස හඳුනාගෙන තිබුනි. | 240,925 | වාර්තා නොමැති නිසා මෙම වත්කම අවභාවිතා කල හැක. | ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් ගෙවීම් ලේඛණය නිකුත් කිරීමේදී ඩී.එස්.එල්.ආර් කැමරාව (රු.240,925) මිළදී ගැනීම වියදම් ලෙස වාර්තා කර තිබුනි.(E 4200 - ලී බඩු සහ උපකරණ) වැරැද්ද හඳුනාගෙන ඇති අතර | වත්කම් අවභාවිතය වලක්වා ගැනීමට ව්‍යාපෘතියේ වත්කම් ලෙස වාර්තා කල යුතුය. |

2020 අප්‍රේල් මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කරනු ලැබේ.

**3. භෞතික කාර්යසාධනය**

**3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රකාශනය**

- ව්‍යාපෘති පරිපාලන අත්පොතට අනුව ව්‍යාපෘතියේ කටයුතු 2018 ජුනි 31 දින ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේවෙතත් අනුකූලතා ගැටළු සම්බන්ධයෙන් ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රමාදයන් හේතුවෙන් 2019 මාර්තු 25 දින කටයුතු ආරම්භ කර තිබුණි. එමනිසා සමාලෝචිත වර්ෂය සඳහා ණය නියෝජිත ආයතනය කරන ලද රු. මිලියන 13,364 කට සමාන එජඩො මිලියන 72.64 කින් සහ ලංකා විදුලිබල මණ්ඩලයේ රුපියල් මිලියන 320 දායක මුදලින් සමාලෝචිත වර්ෂය තුලදී සියයට 13.9 ක් නියෝජනය කරන රුපියල් මිලියන 1,860.09 කට සමාන එ.ජ.ඩො මිලියන 10.28 හා සියයට 170.67 නියෝජනය කරන එකතුව රුපියල් මිලියන 546.14 ක් පමණක් උපයෝජනය කර තිබුණි. තවද ඉඩම් අත්පත් කර ගැනීම මත රු. 104.65 වියදම අයවැය වෙන්කිරීමේ ඇතුළත් කර නොතිබීම සහ අමතර රේගු බදු රුපියල් මිලියන 83.72 ක ගෙවීමක් සිදු කිරීම වැනි හේතු නිසා ප්‍රධාන වශයෙන් ලංකා විදුලිබල මණ්ඩලය විසින් කරන ලද අයවැය ප්‍රතිපාදනය රුපියල් මිලියන 226.14කින් ඉක්මවා තිබුණි.

- ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 48.34ක් වූ අතර එය අපේක්ෂිත ප්‍රගතිය වූ සියයට 65.75ට පසුපසින් පැවතුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂක සහ ගණකාධිකාරී වැනි ප්‍රධාන තනතුරු දෙක ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් විසින් වැඩබලන පදනමින් ආවරණ රාජකාරී ඉටු කිරීම සහ ඉංජිනේරුවන් සුපරීක්ෂකවරු සහ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ තනතුරුවල පුරප්පාඩු පැවතීම ප්‍රමාදයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

  - 2019 දෙසැම්බර් 31 දිනට ඉඩම් කොටස් 42 කින් ඉඩම් කොටස් 20 ක් පමණක් අත්කරගෙන තිබුණු අතර අනෙක් ඉඩම් කොටස් ව්‍යාපෘතිය වෙත භාර දී තිබුණි.

  - 2019 වර්ෂය සඳහා කරන ලද සැලසුම් වලින් පයිලින් වැඩ, නැංමගුරන් කුඩු ස්ථාපනය, සුළං ටර්බයින උත්පාදනයේ අත්තිවාරමේ කුළුණු ආවරණ කටයුතු පිළිවෙලින් සියයට 63.6 ක් , සියයට 40.9 ක් සහ 44.4 ක් ලෙස සම්පූර්ණ කර තිබුණි. කෙසේවෙතත්, සමාලෝචිත වර්ෂය තුලදී නිම කිරීමට අපේක්ෂා කළ 22 ප්‍රමාණයෙන් අත්තිවාරම් පසුපිරවුම් කටයුතු සිදුකර නොතිබුණි.

  - ප්‍රගති වාර්තාවට අනුව සමාලෝචිත වර්ෂය තුලදී නවාතැන් ගොඩනැගිල්ලේ සිවිල් කටයුතු සියයට 40.9 ක් සහ පරිපාලන ගොඩනැගිල්ලේ සිවිල් කටයුතු සියයට 72.7 ක් නිමකර තිබුණි.

**3.2** මානව සම්පත් කළමණාකරනය පිළිබද ගැටළු

| කාර්යය මණ්ඩල තොරතුරු | අනුමත කාර්යය මණ්ඩලය | 2019 දෙසැම්බර් 31 දිනට තත්‍ය කාර්යය මණ්ඩල | 2019 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව | බලපෑම | කළමණාකරනයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂක | 1 | 0 | 1 | ව්‍යාපෘතියේ කටයුතු නියමිත පරිදි සම්බන්ධිකරණය වීම, ක්‍රියාත්මක කිරීම සහ නියාමනය වීම සිදු නොවේ. | කාර්යය මණ්ඩලය බදවා ගැනීමට කිහිප වතාවක් උත්සාහ කර තිබේ. මෙය කළමණාකරනය විසින් සහාය ලබා දිය යුතු කාර්යයක් වේ. මධ්‍යම මට්ටමේ අධීක්ෂණ කාර්යය මණ්ඩලය සහ තාක්ෂණික කාර්යය මණ්ඩලය කොන්ත්‍රාත් පදනම මත බදවා ගැනීමට වර්ෂය අවසානයේ දී මණ්ඩලයේ අනුමැතිය ඉල්ලා ඇත. | කාර්යය මණ්ඩල අවශ්‍යතාවය නිසිපරිදි හදුනාගතයුතු අතර කාලීනව පුරප්පාඩු පිරවීමට කඩිනම් පියවර ගත යුතුය. |
| ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු | 4 | 3 | 1 | | | |
| ගණකාධිකාරි | 1 | 0 | 1 | | | |
| විදුලි අධිකාරී | 8 | 4 | 4 | | | |
| සිවිල් අධිකාරී | 4 | 2 | 2 | | | |
| යාන්ත්‍රික අධිකාරී | 3 | 1 | 2 | | | |
| ලේකම් | 1 | 0 | 1 | | | |
| රියදුරු | 10 | 6 | 4 | | | |
| පුහුණු ක්ෂේත්‍ර නිලධාරින් | 12 | 0 | 12 | | | |
| නුපුහුණු ක්ෂේත්‍ර නිලධාරින් | 04 | 1 | 3 | | | |
| මුළු ප්‍රමාණය | 48 | 17 | 31 | | | |

**3.3** ව්‍යාපෘති කළමණාකරන ඒකකය සම්බන්ධ ගැටළු

| ප්‍රධාන කාර්යය මණ්ඩල තනතුරු | ව්‍යාපෘති කළමණාකරන ඒකකයේ සේවා කාලය | වෙනත් ආයතනයක සේවයේ නියුතු ද නැද්ද යන්න | සේවයේ නියුතු කොන්ත්‍රාත් පදනම/වැඩබලන පදනම | බලපෑම් | කළමනාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|
| ව්‍යාපෘති අධ්‍යක්ෂ | මාස 14 | ඔව් | වැඩ බලන පදනම | ව්‍යාපෘතියේ කටයුතු නිසි පරිදා නියාමනය නොවේ. | 2020 මැයි සිට බලපැවැත්වෙන පරිදි ව්‍යාපෘති අධ්‍යක්ෂක ස්ථිරව පත්කර ඇත .(උපකාරක ලියවිලි ඇමුණුම 10 අමුණා ඇත) | ප්‍රමාදයන්ගෙන් තොරව තනතුරු පිරවිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| ගණකාධිකාරි | අවුරුදු 03 | ඔව් | වැඩ බලන පදනම | ව්‍යාපෘති වියදම් නිසිපරිදි නියාමනය නොවීමට ඉඩ ඇති අතර මූල්‍ය වාර්තාකරනයේ ඉලක්කගත දිනයන් අත්කරගත නොහැකි වීමට ඉඩ ඇත. | ප්‍රමාදයන්ගෙන් තොරව තනතුරු පිරවිය යුතුය. |

**3.4 පද්ධති හා පාලනයන්**

| | නීතිරීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් | බලපෑම් | කළමණාකරනයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|
| | --------------- | ------------------- | ---------- | ------------------ | ------------- |
| (අ) | 1988 දෙසැම්බර් 31 දිනැති අංක 842 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය | ව්‍යාපෘති කළමණාකරන ඒකකය මගින් ව්‍යාපෘතියේ ස්ථාවර වත්කම් ලේඛණය නියමිත පරිදි පවත්වාගෙන නොතිබුණි. | ව්‍යාපෘතිය විසින් වත්කම් කාර්යක්ෂමව භාවිතා නොකිරීමට ඉඩ ඇත. | කළමණාකරන ඒකකය විසින් රජයේ දෙපාර්තමේන්තු සඳහා නිකුත් කරන ලද ආකෘතිය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණය පවත්වාගෙන ඇති අතර, (1907 අංක 77 දරණ චක්‍රෙල්ඛය) මන්නාරම් සුළං බල ව්‍යාපෘතිය සඳහා ව්‍යාපෘති ශාඛාවේ අතිරේක මූල්‍ය කළමණාකරු විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය ප්‍රකාශණය සමග පැතුරුම්පත් ආකෘතිය අනුව සකස් කල ස්ථාවර වත්කම් ලේඛණය සමග සමාන වේ. ලේඛණයේ පවතින වැරදි නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | චක්‍රලේඛ ප්‍රකාරව වත්කම් ලේඛණය පවත්වා ගත යුතුය. |
| (ආ) | ව්‍යාපෘති පරිපාලන අත්පොතෙහි V C (31) වගන්තිය | ව්‍යාපෘතියේ ගණුදෙනු වාර්තා කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර ගිණුම් පවත්වාගෙන | ව්‍යාපෘතියේ වියදම් පැහැදිලිව හඳුනා ගැනීමට නොහැකි වීමට සහ වියදම් මග | වෙනම බැංකු ගිණුමක් හැර මන්නාරම සුලං බල ව්‍යාපෘතිය සඳහා වෙනම ලෙජර් සහ ගිණුම් කට්ටලයක් ව්‍යාපෘති ශාඛාවේ අතිරේක මූල්‍ය කළමණාකරු විසින් | අත්පොතෙහි අවශ්‍යතා සඳහා ව්‍යාපෘති සඳහා වෙනමම ලෙජර ගිණුම් පවත්වා ගත යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | නොතිබුණි. විශේෂයෙන්ම ව්‍යාපෘතියේ ලැබීම් හා ගෙවීම් වාර්තා කිරීම සඳහා වෙනම මුදල් පොතක් භාවිතා කිරීම වෙනුවට ව්‍යාපෘති අංශයේ පොදු මුදල් පොත භාවිතා කර තිබුණි. | හැරීමට හේතු වීමට ඉඩ ඇත. | නඩත්තු කරනු ලැබේ. | |
| (ඇ) | මුදල් රෙගුලාසි 134(3) සහ 2010 ජුලි 26 දිනැති අංක 05 දරණ කළමණාකරන විගණන චක්‍රෙල්ඛය | ව්‍යාපෘතියේ ගණුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත් වී නොතිබුණි. | අභ්‍යන්තර පාලනය නිසිපරිදි ක්‍රියාත්මක වී නොතිබුණි. | ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2017 වර්ෂයේදී ගණුදෙනු සඳහා විස්තීරණ අභ්‍යන්තර විගණනයක් සිදු කර ඇත. | ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුලදී ව්‍යාපෘතියේ කටයුතු අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත්විය යුතුය. |
| (ඇ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | ව්‍යාපෘතිය සමාලෝචිත කාලපරිච්ඡේදය තුලදී අදාල නිලධාරියාගේ වැටුපෙන් අඩු කිරීමකින් තොරව උපයනවිට ගෙවීම් බදු රු. 18,913,212 ඔවුන්ගේ අරමුදලින් ගෙවා තිබුණි. | සුදුසුකම් නොලත් වියදම් දැරීම මගින් ව්‍යාපෘති පිරිවැය වැඩිවේ. | මෙය ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍ය ප්‍රතිපත්තියට අනුව වේ. | උපයන විට ගෙවීම් බදු සේවකයින්ගේ වැටුපෙන් අඩු කර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කල යුතුය. |
| (ඉ) | මුදල් රෙගුලාසි 751 | ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් ව්‍යාපෘතියේ තොග ලේඛණය විධිමත්ව නඩත්තු කර නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු සඳහා වත්කම් භාවිතා කිරීම සහ පැවැත්ම සනාථ කර ගත නොහැකි වේ. | කළමණාකරන ඒකකය විසින් රජයේ දෙපාර්තමේන්තු සඳහා නිකුත් කරන ලද 1907 අංක 77 දරණ චක්‍රලේඛය ප්‍රකාරව තොග ලේඛණය පවත්වාගෙන ඇති අතර ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් පැතුරුම්පත් ආකෘතිය අනුව තොග ලේඛණයකුත් නඩත්තු කර ඇත. ව්‍යාපෘති කළමණාකරන ඒකකය විසින් තොග ලේඛණයේ වැරදි නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ. | තොග ලේඛණය නිසිපරිදි නඩත්තු කල යුතුය. |